15

# සමාස

ලේඛන ව්‍යවහාරයේ දී මෙන් ම කථන ව්‍යවහාරයේ දී ද අර්ථ ප්‍රකාශනය සඳහා නාම පද මුල් වෙයි. සිංහල භාෂාවෙහි යෙදෙන නාම පද, නාම නාම, සර්ව නාම, සමාස නාම, තද්ධිත නාම හා කෘදන්ත නාම යනුවෙන් පස් වැදෑරුම් කොට දැක්වෙයි. මේ අතුරෙන් පද කීපයක් කෙටි කොට ගැනීමෙන් එක් පදයක් බවට සකස් වුණු පද සමාස නාම යනුවෙන් හැඳින්වෙයි. ලේඛනයේ හා භාෂණයේ දීර්ඝත්වය අඩු කොට සංක්ෂිප්ත ගුණය ඇති කිරීම සඳහා සමාස නාම පද උපකාර වේ.

අපි සිංහරාජ වන පියස නැරඹීම සඳහා ගමන් ඇරඹීමු. **ගුරු දෙගුරුන්** සමග **ශිෂ්‍ය ශිෂ්‍යාවෝ** ඊට සහභාගි වූහ. වනපෙතට ඇතුළු වත් ම **තුරුලතා** සිප එන මඳසුළඟත් සෙවණත් නිසා අපේ **ගමන්විඩාව** වියැකී ගියේ ය. රුස්ස ගස් අතුරෙන් පතිත වුණු **හිරුරැස්** වනයෙහි අපූරු රටාවක් මවා ඇත. වනපෙත පුරා **කුරුලුගී** හඬ රැව් දෙයි. හාත්පස **කැලෑමල්** පිපී ඇත. එයින් නැගෙන සුවඳ **ගතසිත** පුබුදුවයි. දිය පහරක් අසල **සිවුපාවුන්ගේ** අඩි සලකුණු දකිත් ම අපට බියක් ද දැනිණි. හිරු **බටහිර** අහසින් සමුගන්නට සූදානම් වෙයි. කාලය නො දැනුවත්ව ම ගෙවී ගොසිනි. **ගුරුබසට** කන් දුන් අපි ගමනේ **ඉමිහිරි** මතකයන් ද පොදි බැඳ වහ වහා බස් රථයට ගොඩ වුණෙමු.

මේ ඡේදයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත පද සෑදී ඇත්තේ වෙන් වෙන් අර්ථ ඇති පද එකතු වීමෙනි.

| | |
|---|---|
| ගුරු ද දෙගුරුන් ද | - ගුරුදෙගුරුන් |
| ශිෂ්‍යයෝ ද ශිෂ්‍යාවෝ ද | - ශිෂ්‍යශිෂ්‍යාවෝ |
| තුරු ද ලතා ද | - තුරුලතා |
| මඳ වේගයෙන් හමන සුළඟ | - මඳසුළඟ |
| ගමනින් වූ විඩාව | - ගමන්විඩාව |
| හිරුගේ රැස් | - හිරුරැස් |
| කුරුල්ලන්ගේ ගී | - කුරුලුගී |
| කැලෑවෙහි මල් | - කැලෑමල් |
| (මනා වූ) සු + ගඳ | - සුවඳ |
| ගත ද සිත ද | - ගතසිත |
| පා සතරක් ඇත්තවුන්ගේ | - සිවුපාවුන්ගේ |
| හිරු බසින දිශාව | - බටහිර |
| ගුරුන්ගේ බසට | - ගුරුබසට |
| (ඉතා) ඉ + මිහිරි | - ඉමිහිරි |

වෙන් වෙන් වූ අර්ථ ඇති පද මෙසේ එක් වීම භාෂාවේ දී සමාස යනුවෙන් හැඳින්වෙයි. ඉහත දැක්වුණු පද සමාස වීමත් සමග මුල් පද එකට සම්බන්ධ කොට තිබූ නිපාත පද ද කෘදන්ත පද ද මුල් පදයේ විභක්ති ප්‍රත්‍යය ද ඇතැම් නාම පද ද ඉවත් වී ඇති බව ඔබට පැහැදිලි වනු ඇත.

උදාහරණ: තුරු ද ලතා ද - තුරුලතා (ද නිපාතය ඉවත් වී ඇත.)
ගමනින් වූ විඩාව - ගමන් විඩාව
(ගමන්+ඉන් වූ) විඩාව - (විභක්ති ප්‍රත්‍යය හා අතීත කෘදන්තය ඉවත් වී ඇත.)
මඳ වේගයෙන් හමන සුළඟ - මඳ සුළඟ
මඳ (වේග+එන්) හමන) සුළඟ - (නාමය, විභක්ති ප්‍රත්‍යය හා අතීත කෘදන්තය ලොප් වී ඇත.

මෙසේ සමාස වීමේ දී අර්ථය මෙන් ම පද ද සංක්ෂිප්ත වී එක් පදයක් බවට පත් වීම බොහෝ විට දැකිය හැකි ය.

සිංහල භාෂාවේ සමාස විධි පහකි.

1. අව්‍යය සමාසය
2. විභක්ති සමාසය
3. විශේෂණ සමාසය
4. අන්‍යාර්ථ සාමාසය
5. ද්වන්ද්‍වාර්ථ සමාසය

## අව්‍යය සමාසය

අව්‍යය පදයක් (උපසර්ගයක් හෝ නිපාත පදයක්) වෙනත් පදයකට මුලින් යෙදී සිදු වන්නේ අව්‍යය සමාසය යි.

**උපසර්ගයක් මුලින් යෙදී සමාස වීම**

| | |
|---|---|
| යාව + ජීව | - යාවජීව (දිවි ඇති තාක්) |
| අනු + බලය | - අනුබලය (පිටුබලය) |
| කු + කවි | - කුකවි (නරක කවියා) |
| දු + සිරිත් | - දුසිරිත් (නරක සිරිත්) |
| සු + මිහිරි | - සුමිහිරි (ඉතා මිහිරි) |
| ප්‍ර + බල | - ප්‍රබල (උසස් බල ඇති) |

මේ සමාස පද සකස් වී ඇත්තේ මුලින් උපසර්ගයක් එක් වීමෙනි.

**නිපාත පදයක් මුලින් යෙදී සමාස වීම**

'න' නිපාතය මුලින් යෙදී මේ සමාස විධිය සිදු වෙයි. 'න' නිපාතය ව්‍යඤ්ජන අක්ෂරයකට මුලින් යෙදේ නම් ඊට 'අ' ආදේශ වේ.

| | |
|---|---|
| න + කුසල් | - අකුසල් (කුසල් නො වනුයේ) |
| න + ප්‍රමාණ | - අප්‍රමාණ (ප්‍රමාණ නැත්තේ) |

ස්වර අක්ෂරයකට මුලින් යෙදෙන 'න' නිපාතය 'අන්' බවට පත් වේ.

| | |
|---|---|
| න + අවශ්‍ය | - අනවශ්‍ය (අවශ්‍ය නො වනුයේ) |
| න + අලස් | - අනලස් (අලස නො වන්නේ) |
| න + ඖචිත්‍ය | - අනෞචිත්‍ය (උචිත භාවයක් නැත්තේ) |

ව්‍යඤ්ජන අක්ෂරයකට පූර්වයෙන් යෙදෙන ‘න’ නිපාතය ඇතැම් විට නො, නු ස්වරූපයෙන් ද සිටී.

න + කැමති - නො කැමති (කැමති නො වන්නේ)
න + සුදුසු - නුසුදුසු (සුදුසු නො වනුයේ)

## විභක්ති සමාසය

ප්‍රථමා හා ආලපන යන විභක්ති දෙක හැර සෙසු විභක්තීන්ට අයත් පදයක් මුලින් යෙදී සිදු වන සමාසය විභක්ති සමාසය නම් වේ.

කම්කරුවන් වෙහෙසී වැඩ කරනු අපි දුටුවෙමු.
මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයෝ නවකතා කීපයක් ලියූ හ.

මේ වාක්‍යවල කම්කරුවන් හා ගත්කරු යන පද සෑදී ඇත්තේ

කම් (වැඩ) + කරන්නේ ගත් (ග්‍රන්ථ) + කරන්නේ

යන පද එක් වී සමාස වීමෙනි. කම්කරුවන් හා ගත්කරු යන සමාස පදවල කම්, ගත් යන පද කර්ම විභක්තියට අයත් බැවින් ඉහත සමාස වූ පද කර්ම විභක්ති සමාස යනුවෙන් ගැනේ.
මේ ආකාරයට විභක්ති හතට අයත් විභක්ති සමාස පහත දැක්වෙන උදාහරණ මගින් හඳුනා ගන්න.

1. ගවයන් පාලනය කරන්නේ - ගවපල් (ගොපල්)
   මෙහෙ කරන්නී - මෙහෙකාරී } කර්ම විභක්ති සමාසය

2. පරා විසින් පුටුයේ - පරපුටු
   දෙවියන් විසින් කියන ලද - දේවභාෂිත } කර්තෘ විභක්ති සමාසය

3. කිරෙන් පිසූ බත් - කිරිබත්
   අතින් කළ කම් - අත්කම් } කරණ විභක්ති සමාසය

4. ජනයාට ප්‍රිය - ජනප්‍රිය
   මුනිඳුට කරන පුද - මුනිපුද } සම්ප්‍රදාන විභක්ති සමාසය

5. ගින්නෙන් වන බිය - ගිනිබිය
   වැස්සෙන් ලැබෙන ජලය - වැසිජලය } අවධි විභක්ති සමාසය

6. ඇතාගේ දළ - ඇත්දළ
   මවගේ කිරි - මවුකිරි } සම්බන්ධ විභක්ති සමාසය

7. රටෙහි වැසි - රටවැසි
   සරත් කාලයෙහි සඳ - සරාසඳ } ආධාර විභක්ති සමාසය

## විශේෂණ සමාසය

විශේෂණ හා විශේෂ්‍ය පද දෙකක් සම්බන්ධ වී සිදු වන සමාසය විශේෂණ සමාසය යි.

නිල් + මහනෙල් - නිල්මහනෙල් (නිල් පැහැ වූ මහනෙල්)
රජ + කුමරු - රජකුමරු (රාජ කුමාරයා)

නිල්මහනෙල් යන්නෙහි නිල් පැහැය මහනෙල් යන්නෙහි ගුණයකි. රජ කුමරු යන්නෙහි රජ යනු කුමරු යන්නෙහි ගුණයකි.

විශේෂණ සමාසය කිහිප ආකාරයකින් සිදු වේ.

සුදු + මල් - සුදුමල් (සුදු පැහැ වූ මල්)
දිගු + වරල - දිගුවරල (දික් වූ වරල)

මෙහි සුදු හා දිගු යන විශේෂණ මල් හා වරල යන පදවලට විශේෂණ වශයෙන් මුලින් යෙදී සමාස වී ඇත.

සේනක + පඬි - සේනකපඬි (පඬිවරයකු වූ සේනක)
ගවුම් + පොඩි - ගවුම්පොඩි (පොඩි ගවුම්)

සේනකපඬි හා ගවුම්පොඩි යන පදවල පඬි හා පොඩි යන විශේෂණ පද යෙදී ඇත්තේ විශේෂ්‍ය පදයට පසුව ය.

සඳ + වත - සඳවත (සඳ වැනි වත)
මුතු + දත් - මුතුදත් (මුතු වැනි දත්)

ඉහත සමාස පදවල සඳ යන්නෙන් ‘සඳ වැනි’ හා මුතු යන්නෙන් ‘මුතු වැනි’ යන උපමාවාචී අර්ථ ප්‍රකාශ වෙයි.

ගුණ + සයුර - ගුණසයුර (සයුර වැනි ගුණ)
මුව + තඹර - මුවතඹර (තඹර වැනි මුව)

ගුණ සයුර හා මුවතඹර යන සමාස පදයන්හි අගට යෙදී ඇති සයුර, තඹර යන විශේෂණ පදවලින් පිළිවෙළින් සයුර වැනි හා තඹර වැනි යන උපමාවාචී අර්ථ පළ වේ.

සංඛ්‍යාවාචී පදයක් යෙදීමෙන් ද විශේෂණ සමාස පද සකස් වේ.

දස + රජදම් - දසරජදම්
තුන් + බිය - තුන්බිය

## අන්‍යාර්ථ සමාසය

වෙන් වූ අර්ථ ඇති පද දෙකක් එකතු වී එම පදවල අර්ථයට වඩා වෙනස් වූ සමාසය (අන්‍ය වූ) අර්ථයක් පළ කරන සමාසය අන්‍යාර්ථ සමාසය නම් වේ.

සිය + පත් යන දෙපදයේ, ඇති 'පත් සියයක් ඇත්තේ' යන අර්ථය ඉක්මවා පළ වන්නේ 'නෙලුම් මල' යන අන්‍යාර්ථය යි.

පහත දී ඇති පද ද අන්‍යාර්ථය පළ කරයි.

| | | |
|---|---|---|
| ති + නෙත් (නෙත් තුනක් ඇත්තේ ) | - තිනෙත් | - ඊශ්වරයා |
| තාර + පති (තරුවලට අධිපති වූයේ) | - තාරපති | - සඳ |
| මල් + අවි (මල් අවි දරන්නේ) | - මලවි | - අනංගයා |
| දිග් + ඇස (දික් වූ ඇස් ඇත්තී) | - දිගැස | - කාන්තාව |
| දස + බල (බල දහයක් ඇත්තේ) | - දසබල | - බුදුන් වහන්සේ |

## දකාරාර්ථ සමාසය

ද නිපාතයෙන් සම්බන්ධ වී ඇති වෙන් වෙන් අර්ථ ඇති පද 'ද' නිපාතය නැතිව ගැළපීම දකාරාර්ථ සමාසය නම් වේ.

| | |
|---|---|
| දුක ද සැප ද | - දුකසැප |
| රන් ද රිදී ද | - රන්රිදී |
| ඉර ද හඳ ද තරු ද | - ඉරහඳතරු |
| දරුවෝ ද දැරියෝ ද | - දරුදැරියෝ |
| අක්කා ද නංගී ද | - අක්කනගෝ |

මුල් පද ගැළපීමේ දී 'ද' නිපාතය ඉවත්ව පද එක් වී ඇත.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සිංහල භාෂාවේ බොහෝ පද සම්බන්ධයෙන් සමාස වීම සිදු වේ. ඒවා එක් කොට හෝ වෙන් කොට ලිවීම සිදු වන අවස්ථා කීපයක් හඳුනා ගනිමු.

සමාස වූ පද එක් කොට හෝ වෙන් කොට එක ම ලේඛනයක සමරූපතාවෙන් යුතුව භාවිතය (සෑම තැන ම එක් ක්‍රමයක් අනුගමනය කිරීම) යෝග්‍ය වේ.

උදාහරණ: හිරුරැස්/හිරු රැස්, තුරුලතා/තුරු ලතා, සුදුමල්/සුදු මල්

අව්‍යය සමාසයෙන් එක් වූ පද එක් පදයක් සේ ලිවිය යුතු වෙයි.
උදාහරණ: අවමන්, නිවැරදි, අහිංසක, සුදන, උපගුරු, අනුකම්පුව

අන්‍යාර්ථ සමාස පද ද එක් කොට ලිවීම යෝග්‍ය වේ.
උදාහරණ: නරසී, සියපත

කර්ම විභක්ති සමාස පද ද එක් කොට ලිවිය යුතු ය.
උදාහරණ: කම්කරුවා, ගත්කරුවා, රන්කරුවා

මහාචාර්ය ජේ.බී. දිසානායක මහතා සමාස නාම පද තවත් අයුරකින් තුන් වැදෑරුම් කොට දක්වයි.

1. ද්විපද සමාස (පද දෙකක් එක් වීමෙන් සෑදෙන සමාස)
   අග නුවර - අගනුවර　　අඹ යාළුවෝ - අඹයාළුවෝ
   කෙටි කතා - කෙටිකතා　　ගුණ දහම් - ගුණදහම්

2. ත්‍රිපද සමාස (පද තුනක් එක් වීමෙන් සෑදෙන සමාස)
   අට දා ගේ - අටදාගේ　　බක් මහ අකුණු - බක්මහඅකුණු
   සඳ කඩ පහණ - සඳකඩපහණ　　දිය වඩන නිලමේ - දියවඩනනිලමේ

3. චතුෂ්පද සමාස (පද හතරක් එක් වීමෙන් සෑදෙන සමාස)
   කව් මිණි මල් දම - කව්මිණිමල්දම
   ඇත් අස් රිය පාබළ - ඇත්අස්රියපාබළ
   මහ වැලි ගං තෙර - මහවැලිගංතෙර
   මල් වතු නා හිමි - මල්වතුනාහිමි

සාම්ප්‍රදායික සමාස විධි පහට අයත් වන පද ද නූතන ව්‍යවහාරයේ ඇති වචන ද සමාස ලෙස යෙදෙන තැන් ද මීට ඇතුළත් වේ. මේ සමාස පද එක් කොට හෝ වෙන් කොට ලිවිය හැකි ය. දහම් සරණ වැනි පැරණි සිංහල ගද්‍ය ග්‍රන්ථවල විසි තිස් ගණන් සංස්කෘත වචන එක් වී සෑදුණු සමාස පද ද දක්නට ලැබේ.



## ලිඛිත අභ්‍යාස

**1. පහත දැක්වෙන පද සමාස කොට ලියන්න.**

i. ඇළ ද දොළ ද
ii. ගල් වැනි හිත්
iii. සු + දන
iv. රජුගේ නියෝග
v. දුක ද සැප ද
vi. මල් වැනි වැස්ස
vii. මලෙහි පැණි
viii. කු + කවියා
ix. තරුණයෝ ද තරුණියෝ ද
x. සඳෙහි එළිය

**2. පහත දැක්වෙන සමාස පද කවර විභක්තියකට අයත් දැයි සඳහන් කරන්න.**

i. මැටියෙන් කළ බඳුන් -
ii. පිනට දෙන හාල් -
iii. බිගුන්ගේ නද -
iv. වැඩ කරනුයේ -
v. වේයන් විසින් නැඟූ පස් -
vi. ගමෙහි වැසි -
vii. කෘමීන්ගෙන් වන හානි -
viii. රනින් කළ අබරණ -
ix. ළමයින් සඳහා ලියූ පොත් -
x. රජුගේ පිරිස -

**3. පහත දී ඇති වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත කොටස් සඳහා සුදුසු සමාස පද ලියන්න.**

i. අපි සීගිරිය නගින අතර **ගලින් බැඳි පඩි** ගණන් කළෙමු.
ii. **සතුන්ට දක්වන කරුණාව** මිනිසුන් වෙතින් ඈත් වෙමින් පවතී.
iii. සැදැහැතියෝ **ඉතා පිරිසිදු** වතින් සැරසී බෝමළුවට රැස් වූහ.
iv. **තරුණයෝ ද තරුණියෝ ද** උත්සවය සංවිධානය කිරීමට වෙහෙසුණහ.
v. අප සමාජය වනසන **නරක සිරිත්** පිටු දැකිය යුතු ය.
vi. පුරාවිද්‍යා කැණීම්වල දී **මැටියෙන් කරන ලද බඳුන්** කීපයක් හමු විය.
vii. දරුවා **කිරි වැනි දත්** විදහා සිනා සුණේ ය.
viii. ඔවුහු **ගුණ ද නුවණ ද** වැඩුණු දරුවෝ වූහ.
ix. අපි සියල්ලෝ ම **ශ්‍රී ලංකාවේ වැසියෝ** වෙමු.
x. ඉන්දීය සාගරයේ **ඉතා බලවත්** භූමිකම්පාවක් ඇති විය.